ලංකාදීප සුව සෙවණ



# ගැබිනි මවට ක්ෂය රෝගය අවදානම්ද?

**ගර්භණී කාන්තාවක් සෑම විටම සිහින මවන්නේ තම කුස ජීවත්වන දරු පැටියා නිරෝගීව බිහිකිරීම ගැනය. එහෙත් මේ කාලයේ මවට විවිධ ලෙඩ රෝග සෑදීම සාමාන්‍ය දෙයකි. ලෙඩ රෝගවලින් ඇය කෙතරම් පරෙස්සම් වුවත් ඊට ගොදුරු වීම සාමාන්‍යයි. එහෙත් එසේ සෑදෙන රෝගය කුස වැඩෙන දරුවාටත් වැළඳේවි දැයි මවට අහියත බියක් දැනේ.**

මේ හැර ගර්භණී කාලයට පෙර විවිධ ලෙඩ රෝගවලින් පෙළෙන කාන්තාවෝ සිටිති. එවැනි කෙනෙක් ගැබ් ගත්තොත් ඊට පිළියම් යොදන්නේ කෙසේ දැයි පවා හොඳින් වෛද්‍යවරයාගෙන් අසා දැනගත යුතුය. මේ ලිපියෙන් පහද දෙන්නේත් එවැනි ගැටලුවක් සම්බන්ධවය.

ගර්භණී කාන්තාවක් වුව ක්ෂය රෝගයට ගොදුරු වීමේ අවදානම තිබේ. ඒ අප ජීවත්වෙන පරිසරයේ මෙම විෂබීජ බෙහෙවින් දක්නට ලැබෙන නිසාය.

මෙම කාලයේ ක්ෂය රෝගයට ගොදුරු වුවා නියා විශේෂ රෝග ලක්ෂණ පහළ වන්නේ නැත. රෝගියකු ඇසුරු කිරීමෙන් හෝ පරීක්ෂණවලින් රෝගය වැළඳී ඇතැයි දැනගත් විගස නිසි ඖෂධ නියමිත ලෙසට නිසි කාලය පුරාවටම ගත යුතුය.

## නොගත යුතු ඖෂධ තිබේද?

ගර්භණී කාලයේ ක්ෂය රෝගී මවට නියම කරන්නේ ගැබෙහි වැඩෙන දරුවාට හානිකර නොවන ඖෂධයි. මෙහිදී ස්ට්‍රෙප්ටොමයිසින් (streptomycin) යන ඖෂධය දෙන්නේ නැත. ඒ ගර්භණී කාලයේ එම ඖෂධය ගත්තොත් ගැබෙහි වැඩෙන දරුවාගේ ශ්‍රවණ ස්නායුවට හානිකර විය හැකි නිසාය.

මේ හැර සෙසු ඖෂධ ගැනීමේ කිසිදු වරදක් නැත. ඒවා නිසි ලෙසටම ගත යුතුය. මෙවැනි මවකට දරුවා කිරිදීමේදී ප්‍රශ්න ඇතිවන්නේ නැත. සාමාන්‍ය ප්‍රසූතියෙන් දරුවා බිහි කළ හැකිය. එසේම කිසිම විශේෂ දරුවා මවගෙන් වෙන් නොකළ යුතුය. මවකිරි දීමට ද කිසිදු ගැටලුවක් නැත. දරු ප්‍රසූති අවස්ථාවේ මවට ක්ෂය රෝග විෂබීජ තිබේ නම් දරුවාට මෙම රෝගය බෝවීම වැළැක්වීමට ඉක්මන් ප්‍රතිකාර කළ යුතුය. මේ සඳහා අයිසොනියාසිඩ් (Isoniazid) නම් ඖෂධය දරුවාගේ බර අනුව වැළඳෙන මාත්‍රාවෙන් මාස හයක් නොකඩවා ලබාදිය යුතුය. ඉන්පසු දරුවාට BCG එන්නත ලබා දෙයි.

බොරැල්ල වෛද්‍ය පර්යේෂණායතනයේ කායික රෝග පිළිබඳ වෛද්‍ය විශේෂඥ
**දර්ශන් ද සිල්වා**

> **ක්ෂය රෝගය නිට්ටාවට සුව කළ හැකිය. අද මේ සඳහා නවීන ඖෂධ තිබේ. එම ඖෂධ අප රටේද බහුල ලෙස භාවිත කරයි. රෝගියා මාස හයක් නිසි ලෙසට නොකඩවා ඖෂධ ගැනීමෙන් රෝගය සම්පූර්ණයෙන්ම සුව වේ.**

## DOTS යනු කුමක්ද?

සෘජු නිරීක්ෂණ ප්‍රතිකාර ක්‍රමය හෙවත් DOTS ප්‍රතිකාර ගැනීම ඉතාම වැදගත්ය. ඒ මේ රෝගයට ලබාදෙන අලුත්ම ප්‍රතිකාර ක්‍රමයයි. මෙම ප්‍රතිකාර ක්‍රමයේදී ඖෂධ ලබා දෙන්නේ අඩුවෙනි. ක්ෂය රෝගය සම්පූර්ණයෙන්ම සුව කිරීම සඳහා අනුගමනය කරන සාර්ථකම ප්‍රතිකාර ක්‍රමය ලෙසට මෙම සෘජු නිරීක්ෂණ ප්‍රතිකාර ක්‍රමය (DOTS) හැඳින්විය හැකිය.

මෙම රෝගයට ප්‍රතිකාර පටන් ගෙන පළමු මාස දෙක තුළදී නිසි ලෙසට ඖෂධ දිනපතා ගැනීම ඉතාම වැදගත්ය. එසේම මෙවැනි රෝගීන් ප්‍රතිකාර ගැනීමට ළය රෝහලකට යාමත් අවශ්‍ය වේ. ඒ ළය රෝහලකින් මෙම රෝගයට අවශ්‍ය නිසි ප්‍රතිකාර උපදෙස් ලබාදීමත් මේ සඳහා රෝහල අවට පමණක් නොව අන ප්‍රදේශවල ජීවත් වන රෝගීන් පවා ප්‍රතිකාර ගැනීම සඳහා රෝහල් සායනයට පැමිණෙන නිසාය. එය වෛද්‍ය උපදෙස් මත දිගුකාලයක් එක වේලක් හෝ අමතක නොකර දිනපතා ගත යුතුය.

## නිට්ටාවට සුව වෙනවාද?

ක්ෂය රෝගය නිට්ටාවට සුව කළ හැකිය. අද මේ සඳහා නවීන ඖෂධ තිබේ. එම ඖෂධ අප රටේද බහුල ලෙස භාවිත කරයි. රෝගියා මාස හයක් නිසි ලෙසට නොකඩවා ඖෂධ ගැනීමෙන් රෝගය සම්පූර්ණයෙන්ම සුව වේ.

## සංකූලතා තිබේද?

මෙම රෝගයට ගොදුරු වීමෙන් සංකූලතා ද ඇතිවේ. එසේ වුවද අද නවීන ඖෂධ තිබේ. එසේම ක්ෂය රෝගියාගේ පෝෂණ තත්ත්වය ගැනත් විශේෂයෙන් සිතිය යුතුය. ඒ මෙවැනි රෝගීන් වැඩි ප්‍රෝටීන සහිත ආහාර ගත යුතු නිසාය. එසේම රෝගීන් හැකි සෑම විටම විවේකීව ජීවත් විය යුතුය. රෝගීන්ට පිරිසුදු වාතාශ්‍රය සෑම විටම ආඝ්‍රාණය කිරීම ද ඉතාම වැදගත්ය. විවේකීව සිට නිසි ඖෂධ ගෙන පෝෂණීය ආහාර ගැනීමෙන් රෝගියාට ඉක්මන් සුවය ලැබේ.

ක්ෂය රෝගයට ප්‍රතිකාර ගන්නා මුල් කාලයේ පටන් රෝගියාට රෝගය සුව යැයි නිතර හැඟේ. මෙම රෝගයට ප්‍රතිජීවක ඖෂධ නියම කරයි. එහෙත් ඒ විශේෂිත ප්‍රතිජීවක ඖෂධයි. සාමාන්‍ය ප්‍රතිජීවක ඖෂධ ඔවුනට නියම කරන්නේ නැත. ඔවුනට නියම කරන්නේ රිෆැම්පිසින් (Refampicin) වැනි ඖෂධ වේ.

## ක්ෂය රෝගය දරුවාට බෝවිය හැකිද?

මෙම රෝගය ඉතා ඉක්මනින් කෙනෙකුගෙන් තවත් කෙනෙකුට බෝවිය හැකි රෝගයකි. එනිසා ක්ෂය රෝගය ඇති මවට කෙළි දුටහොත් රෝගියාගෙන් පිටවෙන සෙම කෙළ යනාදිය ගැන සැලකිලිමත් විය යුතුය. එම දෑ පැහෙන ස්ථානවල හෝ මැස්සන් වහන ලෙසට පිටතට විසි නොකළ යුතුයි.

ප්‍රතිකාර පටන් ගත් පසු රෝගය අන් අයට බෝවන්නේ නැත. එහෙත් කහින විට කිවිසුම් යනවිට මුඛ ආවරණ පැළඳීම ඉතාම අවශ්‍යය. එසේම රෝගියාගේ සෙම තැන තැන නොදැමිය යුතුයි. කිවිසුම් යනවිට මුඛ ආවරණය පැළඳ සිටීම ඉතාම සුදුසුය.

නිතර සෙම පිටවන්නේ නම් පිටවෙන සෙම පුළුස්සා හෝ වළලා දැමිය යුතුය.

එසේම රෝගී මව දරුවා සමග නැවතිය යුතුය. රෝගියා සිටියාට ඖෂධ ප්‍රතිකාර කරන හෙයින් අන් අයට රෝගය බෝවන්නේ නැත. රෝගියා සිටින කාමරය හොඳින් වාතාශ්‍රය ලැබෙන ලෙසට ජනෙල් ඇර තිබූ එළිය හා හොඳ වාතාශ්‍රයත් ලැබෙන සේ සකසා තැබීම ඉතාම සුදුසුය.

සටහන - ශිරානි ගල්ලෑල්ල

NOT FOR SALE
PERSONAL COPY
DISTRIBUTION IS STRICTLY PROHIBITED